රෝහණ බැද්දගේ සමග පිලිසඳරක්

රසික සූරියාරච්චි

මෙවර බක් මහ රංගන සංස්කෘතික 2007 රන් දියවර ප්‍රසංගය සරසන්නට ශ්‍රී ලංකාවේ සිට පැමිණෙන රෝහණ බැද්දගේ කලා ශිල්පියා සමග සුහද පිලිසඳරක යෙදෙන්නට පසුගිය ද අපට හැකි වුනා. මේ ඒ කතා බහ ඇසුරින් සකස් කරන ලද සටහනකි.

බොහොම ස්තූතියි මේ අවස්ථාව අපට ලබා දීම ගැන. රෝහණ බැද්දගේ මහත්තයා ගේ ගම හොරණ ප්‍රදේශයේ බව අප අසා තියෙනවා.

මගේ ගම හොරණ, පාදුක්ක පාරේ උඩුව ප්‍රදේශයයි. මා මුලින්ම ගමේ පාසැලෙන් අධ්‍යාපනය ලැබුවා. ඉන් පසුව හොරණ තක්ෂිලා විද්‍යාලයේ ඉගෙන ගත්තා. ඉන් පස්සෙ හේවුඩ් කලායතනය ට බැදුනා. එහි ඉගෙනීමෙන් පසුව මම ගුරු වෘත්තිය ට අවතීර්ණ වුනා. මම වෘත්තියෙන් නැටුම් ශිල්පියෙක්. උඩරට නැටුම් කලාව තමයි ඉගැන්නුවේ.

අප නම් බැද්දගේ මහත්තයා ගැන මුලින්ම ඇහැව්වෙ මගෙ රත්තරං හෙලේනා කියන ගීතයෙන් ගායකයෙක් විදිහට යි.

ඇත්තටම සංගීතය සහ ගායනය මම මගේ වෘත්තියට අමතරව කළ දෙයක්. ඒ ගීතය මම 1968 දී පමණ ලියා ගායනය කළා එවකට මකුලොළුව මහත්තයා මෙහෙයවපු වැඩසටහනක දී. රත්තරං හෙලේනා ගීතයේ -කවිද?" කියන කොටස කිව්වේ එම වැඩසටහනට සහභාගී වුනු ටී. එම්. ජයරත්න මහත්මයායි. ගීතය පටිගත කළේ නම් කලකට පසුව 1974 දී. සංගීත පර්යේෂණ අංශයේ සඳැල්ල වැඩසටහන වෙනුවෙන්.

එතකොට බන්දුල විජේවීර සමග බබ ගායනා කළ ඉතාමත් ජයප්‍රිය වුනු මාමයි බැහැයි ගීත?

ඒ ඊට දශකයක ට පමණ පස්සේ 1982 දී විතර. ගීත ක්ෂේත්‍රයට පිවිසුනත්, මා 1986 වන තුරු පාසැල් වල නැටුම් ගුරුවරයෙක් විදියට සේවය කළා. ඉන් පසු සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ ජන සංගීතය ඉගැන්වීමට පටන් ගත්තා.

බබේ නාට්‍ය රංගන පිලිබඳව කතා කළොත්?

මා මුලින්ම 1974 දී දයානන්ද ගුණවර්ධන ගේ ගජමන් පුවත නාට්‍යයයට සම්මන්ධ වුනා. ඉන් පසු ඔහුගේ ම ජසයා සහ ලෙංචිනා, මධුර ජවනිකා, ආනන්ද ජවනිකා යන නාට්‍ය වල සංගීතය සහ නැටුම් අධ්‍යක්ෂණය කළා. ජයලත් මනෝරත්න ගේ අන්දරේලා ඇතුළු නාට්‍ය කිහිපයකටම සංගීතය නිර්මානය කළා. මුලින්ම ටෙලි නාට්‍යයක රඟපෑවේ පලිඟු මැණිකේ නාට්‍යයේ 1982 දී.

මේ දිනවල මොනවගේ කලා කටයුතු වලද නිරත වෙලා ඉන්නේ?

මේ දවස්වල නම් කිසිම විවේකයක් නැහැ. අවුරුදු ලංවෙන කොට හැම මාධ්‍යයටම කොහා මතක් වෙනව වගේ රෝහණ බැද්දගේ ව මතක් වෙනවා. රූපවාහිනී වැඩ සටහන් එක දිගටම යෙදී තියෙනවා.

මාමයි බැහැයි ගීත එකතුවට අමතරව වෙනත් කැසට් පට, සංයුක්ත තැටි හෙම නිෂ්පාදනය කරල තියෙනවද?

මේ දිනවල මගේ පැරණි ගීත නැවත පටිගත කරන ව්‍යාපෘතියක් අරඹලයි තියෙන්නේ. මම තැටි දෙකක් පසුගිය කාලයේ කළා ඒ සන්ෆලවර් වගේ සංගීත කණ්ඩායම් එක්ක. නමුත් ඒව මගේ සංගීත ආරයට ගැලපෙන ඒව නෙවේ.

ඉඟ දෙනෙක් බය නව රිද්ම වැඩේ කළා නේද? ඒව නම් හොඳ නිර්මාණ වුනේ නැහැ කියලයි මට හිතෙන්නේ.

ඇත්තටම වෙළඳ ව්‍යාපාරිකයෝ යි ඕව කරන්නේ. ඒ අය මා එක්ක බෙර හෙම ගහල ගීත ගායනා කරල අවසාන වුනාට පස්සේ, පසුබිම් සංගීතය වෙනස් කරනවා බටහිර නාද වලට.

ඉතිං ඒක හරි අපරාධයක් නේ. කැමැත්ත නොදී එහෙම කරන්නේ කොහොමද?

මගෙන් කළ ඉල්ලීමට යි මම කැමති වුනේ මගේ ගීත වලට හානියක් නොකරන වාචික පොරොන්දුව මත. නමුත් එහෙම වගන්තියක් ලිඛිත ගිවිසුම් වල නැති නිසා මට ක්‍රියාත්මක වෙන්න බැරි වුනා.

සන්ෆලවර්ස් ල එක්ක ගී ගයපු ගුණදස කපුගේ මහත්මය නම් ඒ ගැන විමසූ වෙලාවෙ කිව්වෙ මුදල් අවශ්‍ය නිසා එලෙස ගී කිව්වාය කියලයි.

ඔව් මුදලුත් වැදගත් තමයි. නමුත් ආයෙ නම් එහෙම දේවල් කරන්න මගේ අදහසක් නැහැ.

අපි දන්නවා විශාරද දයාරත්න සහ මහාචාර්ය රණතුංග ගායක යුවලත් බවුන් ගේ ගීත රැප් කිරීමක් කළා. මේ පිලිබඳ බබේ සාමාන්‍යයෙන් අදහස මොකක්ද?

ඒ අයගේ අදහස තමයි අළුත් වන ලෝකයට ගැලපෙන පරිදි අප වෙනස් විය යුතුයි යන්න. මම විශ්වාස කරන විදියට නම් අපේ ගීත රස විඳින්න රැප් කරන්න අවශ්‍ය නැහැ. මේක වානිජ බලපෑම් නිසා, වෙළෙන්දන් ගේ කැමැත්ත අනුව ඇතිවෙන දෙයක්. ඔවුන් හිතනවා එලෙස කළ විට වැඩියෙන් මුදල් හම්බ කළ හැකිවේවි කියා. අද ලංකාවේ සංගීතය මුලින්ම ත්‍රී රෝද රථ සහ පෞද්ගලික බස් රථ රියදුරන්ගේත්, රසඥතාවය අනුවයි සිදුවෙන්නේ. සමහර විට මේ ඉදිරියේ අප අසරණ වෙනවා.

පසුගිය කාලේ ලංකාවේ මහත් ආන්දෝලනයකට කල් වුනා මේ එෆ්. එම්. නාලිකා වල පාවිච්චි කරන සිංහල භාෂාවේ පරිහානිය. හැබැයි මෙතනදී කෙනෙකුට තර්ක කරන්න පුළුවන් භාෂාව, සංගීතය වැනි දේ කාලයත් සමග ක්‍රමක්‍රමයෙන් වෙනස් වී යා යුතුයි, එසේ නොවුන හොත් ඒවායේ කිසිම දියුණුවක් වෙන්නෙ නෑ කියා. මේ පිලිබඳව බබේ අදහස?

ඔව් සංස්කෘතියක් එලෙස වෙනස් වෙමින් යා යුතුයි තමා. ඒ වුනත් අපිට ජාතියක් වශයෙන් අනන්‍යතාවයක් අවශ්‍යයි එය රැක ගත යුතුයි. අපි මේ ගැන සැලකිලිමත් වුනේ නැතිනම් අප ඉතා ඉක්මනින්ම සංකර ජාතියක් වේවි. බස රැකුනොත් තමා ජාතියක් රැකෙන්නේ. භාෂාව විකෘති කිරීම මහා අපරාදයක්.

දැන් සිංහල භාෂාවට, දෙමල භාෂාවෙන් වචන විශාල සංඛ්‍යාවක් එකතු වෙලා තියෙනවා. අපි සිංහල සංගීතයක් ගැන කතා කළත්, එයට හින්දුස්ථානි රාගධාරී සංගීතයේ බලපෑම ඉතා විශාලයි. එහෙම නම් පෙරදිග සංගීතයෙන්, භාෂා වලින් අපේ සංගීතයට, අපේ භාෂාවට ඇතිවන බලපෑම ට වඩා වැඩියෙන් අපරදිග සංගීතයෙන්, ඉංග්‍රීසි භාෂාවෙන් වෙන බලපෑම අපිට වැඩියෙන් දැනෙනවා වගේ නේද?

ඔව් ඉන්දියානු සංගීතය දැන් වසර සීයක් තිස්සේ අපේ රටේ ජන ජීවිතයට හොඳින් මුසු වෙලා. අපිට තවමත් සංගීතය පිලිබඳව ඥාණය ලාබාගන්නට පුළුවන වන්නේ භාරතීය සංගීතය හැදෑරීමෙන් තමා. ජන සංගීතය එලෙස ශාස්ත්‍රීයව එවමත් ඉගැන්වෙන එකක් නෙමෙයි. නමුත් පර්යේෂණ මගින් අපේ ස්වර මාධ්‍යය හඳුනා ගෙන අපේ ජන සංගීතය සඳහාත් ශාස්ත්‍රීය පදනමක් ගොඩ නගන්නට හැකි වේවි. දැන් අපේ රටේ තරමක උනන්දුවක් තියෙනවා ජන සංගීතය මානව වංශ සංගීතය (එත්නො මියුසිකොලොජි) යන පුළුල් විෂයය යටතේ අධ්‍යයනය කරන්න. මෙය දැනට ඇමෙරිකාව වැනි රටවල කෙරෙන දෙයක්.

අපිට ජාතියක් වශයෙන් අනන්‍යතාවයක් අවශ්‍යයි එය රැක ගත යුතුයි. අපි මේ ගැන සැලකිලිමත් වුනේ නැතිනම් අප ඉතා ඉක්මනින්ම සංකර ජාතියක් වේවි. බස රැකුනොත් තමා ජාතියක් රැකෙන්නේ. භාෂාව විකෘති කිරීම මහා අපරාදයක්.

එතකොට ලංකාවේ සෞන්දර්ය විශ්ව විද්‍යාලය වැනි තැන්වල මේ ගැන පර්යේෂණ කෙරෙනවාද?

මම මේ ගැන තරමක වැඩ කොටසක් පටන් අරගෙන තියෙනවා. දැනට පලවී ඇති ග්‍රන්ථ පරිශීලනය කරමින්, සිංහල ජන සංගීතය ගැන නිබන්ධනයක් සම්පාදනය කරන්නට පටන් අරගෙන තියෙනවා. මම මීට පෙර සිංහල සංගීත ශෛලය නමින් ග්‍රන්ථයක් ප්‍රකාශ කරල තියෙනවා. එය සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් දෙවන වරටත් මුද්‍රණය කළා පසුගිය දිනවල.

බබ ගැයූ රාජා බී මංගලියා ගීතයේ නාලය සහ සංගීතය කොයි ආකාරයෙන් ද වර්ග කරන්න පුළුවන්?

ඒ ගීතයේ වැදි ගී තාල මූලාශ්‍රයක් තියෙනවා. එය මා දියුණු කරලා යි නිර්මාණයක් ලෙස එලි දැක්වූයේ.

එතකොට ඉදිරි කාලෙදි මොන වගේ වැඩ කරන්නද බලාපොරොත්තු වෙන්නේ?

එත්නො මියුසිකොලොජි ගැන පර්යේෂණාත්මක ග්‍රන්ථයක්, අපේ ජන සංගීතයේ මූලාශ්‍ර එකතුවකුත් සමග ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මගේ වයස අවුරුදු 71 ක් වෙනවා. මම සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ බාහිර කතිකාචාර්ය තනතුරෙන් ඉවත්වෙලා සිංහල ජන සංගීතය පදනම් කරගත් සංගීත කණ්ඩායමක් ගොඩ නගන්න අදහස් කරනවා. මම හිතන විදියට අද කාලයේ අවශ්‍යතාවයක් මේ පිටින් එන රැල්ලට මුහුණ දීම සඳහා අපේම දේවල් ඉදිරියට ගැනීම. මෙය ඇත්තටම අද වාතාවරණය අනුව උඩුගම් බලා යනවා වගේ වැඩක්. අද මාධ්‍ය වලින් මේ ජන සංගීතය වැනි අංශ වලට කිසිම අනුග්‍රහයක් නැහැ. ඔවුන් මුදල් පසුපසම ලුහුබඳින නිසා. කලාව දියුණු කිරීම ඔවුන් ගේ පරමාර්ථයක් නොවෙයි. මේ අතර සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ජන සංගීත අනු මණ්ඩලයේ සභාපති හැටියට මාව පත්කරල තියෙනවා. දෙපාර්තමේන්තුවේ සහයෝගය මගේ වැඩ පිලිවෙල ට ලබා දෙන බවට දැනට පොරොන්දු වී තියෙනවා.

ගුරුවරයෙකු ලෙසත් කතිකාචාර්ය වරයෙකු ලෙසත් වැඩ කල බබට ගෝලයින් සිය ගනනක් ඇති. ඒ අතරින් බබ ජන සංගීත ක්ෂේත්‍රයේ කරන වැඩ කොටස ඉදිරියට කරගෙන යන්න හැකි ගෝලයෙක් හෝ ගෝල පිරිසක් ඉන්නවද?

ඔව්, ඇත්තටම විශ්ව විද්‍යාලයේ දැනට ජන සංගීතය උගන්වන පස් දෙනෙක් පමණ ඉන්නවා. ඔවුන් සියළු දෙනාම මගෙන් ඉගෙන ගත් අය. මගේ ගෝලයෝ යැයි සලකන්න පුළුවන්. ඔවුන් ජන සංගීතය පිලිබඳව දරන්නේ මා දරණ මතයමයි. හැබැයි, ප්‍රායෝගිකව මං වාගේ ගායනා කරන කෙනෙක්, තවත් රෝහණ බැද්දගේ කෙනෙක් හදන එක නම් අමාරු වැඩක්.

අප දන්නවා කලාකරුවන් සමහරු දේශපාලනයට සම්බන්ධ වෙන ප්‍රවනතාවයක් සාමාන්‍යයෙන් තියෙනවා. බබ කිසියම් ආකාරයක දේශපාලනයක නිරත වෙනවාද?

නැහැ. මම කිසිම දේශපාලනයක නිරත වෙන්නේ නැහැ. කිසිම පක්ෂයකට සම්බන්ධත් නැහැ. එහෙම නොකළේ මට කලාකරුවෙකු වශයෙන් ස්වාධීනව මගේ මතය ඉදිරිපත් කරන්නට, ඒ වෙනුවෙන් කතා කරන්නට අවශ්‍ය නිසයි. කලාකරුවන් දේශපාලනයෙන් ඈත් වෙන තරමට හොඳයි කියායි මා හිතන්නේ. දේශපාලනයට සම්බන්ධවුනොත් ගැත්තෙක් වෙන්න සිදු වෙනවා. එවිට කලාකරුවාගේ පෞරුෂය නැති වෙනවා.

අහන්නත් සංතෝෂයි. ඒක ඉතාමත්ම වැදගත් ප්‍රකාශයක්. ඇත්තටම අපේ ඊමේල් මගින් යවන නොරතුරු ලිපියකත් අපි සඳහන් කළේ බැද්දගේ මහත්තයා අදීන කලාකරුවෙක් කියලයි.

ඔව්, කිසිම කෙනෙකුට ගැතිවෙන්න මම කැමති නැහැ. මම දෙපයින් නැගී සිටින කෙනෙක්.



සේයාරූ ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පාලිත ගනේවත්ත/විජය කරුණාසේන